**සුරාබදු ආඥාපනත**

**අංක 11/2018 දරන සුරාබදු නිවේදනය**

සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරිය වූ) 32 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මා විසින් මෙම නිවේදනය මඟින් 2018 ජනවාරි මස 18 වන දින අංක 2054/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 03/2018 දරන සුරාබදු නිවේදනයේ උප ලේඛනයේ අංක 2 හි දැක්වෙන රා තැබෑරුම් විවෘත කරනු ලබන හා වසනු ලබන වේලාවන් 2018 ජුනි 13 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස පහත උපලේඛනයේ දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018 ජුනි 13 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| ***I* වැනි තීරුව** | ***II* වැනි තීරුව** |
|---|---|
| **බලපත්‍ර වර්ගය** | **විවෘතව තැබිය යුතු වේලාවන්** |
| (i) රා තැබෑරුම් | පෙ.ව. 11.00 සිට ප.ව 2.00 සහ<br>ප.ව. 5.00 සිට ප.ව. 8.00 |
| (ii) රා තැබෑරුම් (සමූපකාර ක්‍රමය යටතේ ක්‍රියාත්මක) | පෙ.ව. 8.00 සිට ප.ව. 9.00 දක්වා |

02. අර්ථ නිරූපණය : “සමූපකාර ක්‍රමය යටතේ“ යන්න පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සමූපකාර සමිති හෝ සංගම් අදහස් වේ.